ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිව රැකියා සඳහා විදේශගතව සිටි/සිටින දෙමාපියන්ගේ දූ දරුවන් වෙනුවෙන් 2022 වසරේදී ශිෂ්‍යත්ව පිරිනැමීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් අයදුම්පත් මාර්ගගත ක්‍රමය ඔස්සේ ( Online ) කැඳවනු ලැබේ.

**සුදුසුකම්**

**අ ) 5 වසර ශිෂ්‍යත්ව**

- අදාල අයදුම්කරුගේ මව හෝ පියා 2017.01.22 දින සිට 2022.01.22 දින දක්වා අතර කාලය තුල කාර්යාංශයේ ලියාපදිංචිය ලබා විදේශ ගත වී රැකියාවක නිරතව සිටිය යුතුය.
- 2021 වර්ෂයේ පැවති 5 වසර ශිෂ්‍යත්ව විභාගයෙන් දිස්ත්‍රික්ක කඩඉම් ලකුණු ලබා සමත් විය යුතුය.

**උඩුගත කල යුතු ( Upload ) ලිපි ලේඛණ**

- දරුවාගේ උප්පැන්න සහතිකයේ මුල් පිටපතෙහි පිටපතක්
- දරුවාගේ විභාග සහතිකයේ මුල් පිටපතක්
- මව/පියාගේ විදේශ ගමන්බලපත්‍රයේ ඡායාරූප සහිත පිටුවේ පිටපතක්

**සැලකිය යුතුයි**

- දරුවා ඉගණුම ලබන පාසලේ විදුහල්පතිතුමා විසින් සහතික කරන ලද දරුවාගේ විභාග සහතිකයේ හා සහතික කරන දරුවාගේ උප්පැන්න සහතිකයේ පිටපත් **පහතින් සඳහන් කර ඇති ලිපිනය** ලියාපදිංචි තැපෑලෙන් වෙත යොමු කරන ලෙස හා එම ලිපි ලේඛණවල දකුණු පස කෙළවරේ අයදුම් පත්‍රය සම්පූර්ණ කිරීමෙන් පසු ඔබට ලැබෙන **යොමු අංකය (reference no) සඳහන්** කර එවන ලෙස කාරුණිකව දන්වා සිටිමි

**ආ ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) ශිෂ්‍යත්ව**

- අදාල අයදුම්කරුගේ මව හෝ පියා 2016.03.01 දින සිට 2021.03.01 දින දක්වා අතර කාලය තුල කාර්යාංශයේ ලියාපදිංචිය ලබා විදේශ ගත වී රැකියාවක නිරතව සිටිය යුතුය.
- 2020 වර්ෂයේ පැවති අ.පො.ස. (සා/පෙ) විභාගය අවම වශයෙන් ගණිත විෂය ඇතුළුව විෂයන් 06 කින් සමත්ව ඉන් විෂයන් 03 ක් සඳහා සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස (උ/පෙ)හදාරමින් සිටින ශිෂ්‍ය ශිෂ්‍යාවන් විය යුතුයි.

**උඩුගත ( Upload ) කල යුතු ලිපි ලේඛණ**

- දරුවාගේ උප්පැන්න සහතිකයේ මුල් පිටපතෙහි පිටපතක්
- දරුවාගේ විභාග සහතිකයේ පිටපතක්
- දරුවාගේ ජාතික හැදුනුම්පත පිටපතක්
- මව/පියාගේ විදේශ ගමන්බලපත්‍රයේ ඡායාරූප සහිත පිටුවේ පිටපතක්

**සැලකිය යුතුයි**

- දරුවා ඉගණුම ලබන පාසලේ විදුහල්පතිතුමා විසින් සහතික කරන ලද දරුවාගේ විභාග සහතිකයේ හා සහතික කරන ලද දරුවාගේ උප්පැන්න සහතිකයේ පිටපත් **පහතින් සඳහන් කර ඇති ලිපිනය** වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලෙස හා එම ලිපි ලේඛණවල දකුණු පස කෙළවරේ අයදුම් පත්‍රය සම්පූර්ණ කිරීමෙන් පසු ඔබට ලැබෙන **යොමු අංකය (reference no) සඳහන්** කර එවන ලෙස කාරුණිකව දන්වා සිටිමි

**ඇ ) අ.පො.ස (උසස් පෙළ) ශිෂ්‍යත්ව**

- අදාල අයදුම්කරුගේ මව හෝ පියා 2015.10.12 දින සිට 2020.10.12 දින දක්වා අතර කාලය තුල කාර්යාංශයේ ලියාපදිංචිය ලබා විදේශ ගත වී රැකියාවක නිරතව සිටිය යුතුය.
- 2020 වර්ෂයේ අ.පො.ස (උසස් පෙළ) සමත් වී රජයේ විශ්ව විද්‍යාලයක පූර්ණ කාලීන අභ්‍යන්තර උපාධි පාඨමාලාවක පලමු වසරේ අධ්‍යාපනය හදාරමින් සිටිය යුතුය.

**උඩුගත ( Upload ) කල යුතු ලිපි ලේඛණ**

- දරුවාගේ උප්පැන්න සහතිකයේ මුල් පිටපතෙහි පිටපතක්
- දරුවාගේ විභාග සහතිකයේ පිටපතක්
- දරුවාගේ ජාතික හැදුනුම්පතෙහි පිටපතක්
- උසස් අධ්‍යාපනය හදාරණ දරුවන් සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්ව විද්‍යාලය සඳහා තෝරා ගත් බවට එවන ලිපිය
- මව/පිය ගේ විදේශ ගමන්බලපත්‍රයේ ඡායාරූප සහිත පිටුවේ පිටපතක්

**සැලකිය යුතුයි**

- විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරී විසන් හෝ පාසලේ විදුහල්පතිතුමා විසින් සහතික කරණ ලද දරුවාගේ විභාග සහතිකයේ පිටපතක්, සහතික කරන ලද දරුවාගේ උප්පැන්න සහතිකයේ පිටපතක් හා විශ්ව විද්‍යාල හැඳුනුම්පතේ ඡායා පිටපතක් **පහතින් සඳහන් කර ඇති ලිපිනය** වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලෙස හා එම ලිපි ලේඛණවල දකුණු පස කෙළවරේ අයදුම් පත්‍රය සම්පූර්ණ කිරීමෙන් පසු ඔබට ලැබෙන **යොමු අංකය (reference no) සඳහන්** කර එවන ලෙස කාරුණිකව දන්වා සිටිමි

- **අයදුම්පත්‍රය යොමු කල හැකි අවසාන දිනය : 2022.07.15 වේ**

**ඉහතින් සඳහන් කර ඇති ලිපි ලේඛණ එවිය යුතු ලිපිනය**
කළමණාකරු සුභසාධන,
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය,
සුභසාධන අංශය,
අංක 234, ඩෙන්සිල් කොබ්බැකඩුව මාවත,
කොස්වත්ත, බත්තරමුල්ල.
☎ 011-2880500 (දිගු අංකය -124)